# සිංහල නාට්‍ය වේදිකාව සෝදාපාලු කළ ටෙලි නාට්‍ය සුනාමි ව්‍යසනය

**නාට්‍යවේදී එස්. කරුණාරත්න**

**60'** දශකය සිංහබාහු, මූදුපුත්තු, ජනේලය, බක්මහ අකුණු, බෝඩිංකාරයෝ, සාමා, එරබදු මල් පොට්ටු පිපිලා, කොරා සහ අන්දයා, කවුරුවත් එන්නේ නෑ, පුටු යන විවිධ පරාශයන් හා නාට්‍ය ක්‍රමවේදයන් සුවිශේෂී ලෙස සනිටුහන් කරමින් සිංහල වේදිකා නාට්‍ය සශ්‍රීක කළ කාල පරාසයක් සේ හැඳින්වීම අතිශයින් ම නිවැරදිය. මෙම සශ්‍රීක වේදිකාව මත මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර, ගුණසේන ගලප්පත්ති, හෙන්රි ජයසේන, දයානන්ද ගුණවර්ධන, සුගතපාල ද සිල්වා, ජී. ඩී..... පතිරාජ, එල් එස්. දයානන්ද, ධර්මසේන පතිරාජ, ධම්ම ජාගොඩ වැනි ප්‍රබුද්ධ නිර්මාණ ශිල්පීන් විවිධාකාර වූ නාට්‍ය ක්‍රම වේදයන් පර්යේෂණයට භාජනය කරමින්, 60 දශක තුල නොයෙක් හරඹ දැක්වූ බව ඔවුන් හා එක්ව ගැටවර වියේ සිට සක්‍රියව ක්‍රියා කල අපට ප්‍රකාශ කළ හැකිය. එදා වේදිකාව පූජනීය ස්ථානයක් සේ සලකා කටයුතු කිරීමට එම නාට්‍යවේදීහු උත්සුක සංයමයකින් යුතුව සිය කාර්යයේ සමාධිගතව, කිසිම භාදාවකින් තොරව සිය ප්‍රාථමික අධ්‍යනය විවිධ නාට්‍යකරුවන් සමඟ විවිධ නාට්‍ය ක්‍රමවේද අනුව නිපැයූ නාට්‍ය සීමිත සංඛ්‍යාවක් රඟපාමින් කිරුළු පලන් රැජිනක් වීමට වාසනාවන්ත වූවාය. මීට අමතරව චන්ද්‍රා කළුආරච්චි, ප්‍රේමා ගනේගොඩ, ලියෝනි වීරසිංහ, අනුලා කරුණාතිලක, සොමලතා සුභසිංහ, මානෙල් වීරමුණි, ටෝනි රණසිංහ, ජී. ඩබ්. සුරේන්ද්‍ර නාමෙල් වීරමුණි,

**එදා නාට්‍යකරණයේ ප්‍රායෝගික අත්දැකීම් සමඟ අපූරු උත්තේජනයක් ලද මා අද මේ ව්‍යසනය හමුවේ මන්දගාමී අලසයකු බවට පත්වෙමින් සිටින්නෙමි. ටෙලි බහිරවයා සමඟ ගැටෙන්නට අද මට බැරිය. වෑත්තෑවේ හිමියන් එදා ගුත්තිල පඬිතුමාගේ මුවට නැංවූ කවි පදයක් මගේ උපවිඥානයේ රාවප්‍රතිරාවය වේ. "මට මහළු වයසේ බැරිය වෙන ගායනා පෙර සේ..." මූසිලගේ තරුණ මදයෙන් වැයෙන වීණා හඬ පරයා, තත් සිඳුන වීණයෙන් නැඟී හඬට ගතානුගතික ශක්‍රය, විසින් නව පණක් පොවන ලදී. එහෙත් සතර දෙසින් ඇසෙන විවිධාකාර වූ කැනහිල් හූ හඬ පරයා සුමට හඬක් නැංවීමට තරම් සමත් ඉන්ද්‍රජාලයකින් අද අප අතර නොමැති වීම අපේ ම කරුමයක් නොවන්නේ ද ?**

නවනන්ද විජේසිංහ සහ විමල් කුමාර ....... මෙම යුගයේ දී කිරුළුපලන් අනෙක් නළු නිළියෝ වූහ. මෙහිදී මාලිනීගේ මෙම පුණරාගමණය පිළිබඳ





වූහ. ලෝකයේ අන්රටවල එකල නාට්‍යකරණය උදෙසා වූ යටිතල පහසුකම් ඉතා ඉහළ මට්ටමක පැවතිය ද අපේ නාට්‍යකරුවන් පවතින තත්වයන්ගෙන් අධෛර්යයට පත් නොවී මහත් වූ කැපවීමකින් හා පරිත්‍යාගශීලීව මෙම කලා විෂයෙහි නිරතවූයෙන් දූපතේ නාට්‍ය වේදිකාව, 60 දශකයේ දී සවිමත් අත්තිවාරමක් මත ගොඩනැංවිනි. එදා නාට්‍යකරුවන්ගේ ශක්තිමත් කැපවීමම ඔවුනට ජයක් සවියක් වූ බව කිව මනාය. ශ්‍රී ලංකා නාට්‍ය ඉතිහාසය දෙස විමසුම් ඇස් යොමු කිරීමේ දී මෙම කැපවීම හා භක්තිය අප ලද ජන්ම උරුමයක් බව නිගමණය කළ හැකි වේ. කෝලම්, නාඩගම්, නූර්ති, ටවර්හෝල් නාටක, ජයමාන්න යුගය, ඉන් පරිභාහිරව ජබාල් - ලුඩොවයික් වැනි විදේශ නාට්‍ය කරුවන්ගේ අධීක්ෂණය මත වර්ධනය වූ විශ්වවිද්‍යාල නාට්‍ය මෙම උරුමයේ විවිධ පැතිකඩ හරහා වර්ධනය වීමට විවිධාකාරයෙන් පිටුවහලක් වූ බව කිවමනාය.

මෙවන් පසුබිමක් මත ක්‍රමිකව ගොඩනැගුණු සිංහල වේදිකා නාට්‍යයේ ස්වර්ණමය යුගය වූයේ 6' දශකයේ මතු සඳහන් වූ සුවිශේෂී නිර්මාණකරුවන්ගේ අප්‍රතිහත කැපවීම හේතුකොට ගෙන ය. දශක හතරක ගෙවී යත් ම මෙම තත්වය නොසිතූ විරූ අන්දමින් වෙනස්වී ඇති බැව් එම යුගයේ සිට සක්‍රියව නාට්‍යකරණයේ නියුතුව සිටි අපට වගකීමක් ඇතිව ප්‍රකාශ කළ හැකි වේ. 60' දශකය ආරම්භයේ සිට වසර දහයක් ගෙවී යන තෙක් සජීවී නාට්‍යකරණයට සම්බන්ධ වී සිටි, අද මහා රංග වේදිනියක්ව සිටින මාලිනී ෆොන්සේකා එදා වේදිකා නාට්‍ය හා සම්බන්ධ වී සිය නාට්‍ය තක්ෂිලාවේ කටුකොහොල් හරහා දුෂ්කර ගමන් මඟක් තරණය කරමින් එහෙත් මනා ඌණ පූරණයක් කිරීමට මම කැමැත්තෙමි. 60' දශකයේ දී පමණක් නමෝවිත්තියෙන් සජීවී වේදිකාවේ හරබර අත්දැකීම් සහ ප්‍රායෝගික පුහුණුවක් ඇයට ලබා ගැනීමට මගේ ම නාට්‍ය පහක අවස්ථාවක් ලැබිණි. 'ගුත්තිල' 'මළවුවන්ගේ' 'එරබදු මල් පොට්ටු පිපිලා' 'අකල් වැස්ස' 'හිරු අවරට ගියාදෝ' එම නාට්‍ය පහය. ඊට අතිරේකව සුනන්ද මහේනද්‍රගේ 'සයුරෙන් ආ ලඳ' ගුණසේන ගලප්පත්තිගේ 'ලියතඹරා' රංජිත් ධර්මකීර්තිගේ 'මහගෙදර' සුමන ආලෝක බණ්ඩාර ගේ 'නිදිකුම්භා' ඇය රඟ පෑ අනෙක් නාට්‍යයන්ය. මෙම වසර දහයක අඛන්ඩ සුවිශේෂී අධ්‍යන පාඨමාලාව ඇගේ ඉදිරි අනාගත රංගන කාර්යය සඳහා ප්‍රාථමික පුහුණු පාඨමාලාවක් වූ බව කීම අතිශයෝක්තියක් නොවන්නේය. ඇය සජීවී රංග කලා සරසවියේ පූර්ණ පාඨමාලාවක් කිසිම බාධකයකින් තොරව සම්පූර්ණයෙන් නිමා කොට, අජීවී සැලෝලයිඩ් පටයට අවතීර්ණ වූවාය. කැමරාවේ 18" සිට 35" දක්වා වු කැමරා කාචයන්, ඉතා සමීප දසුන්, මධ්‍ය රූප, දිගු දසුන්, හැඟීම් උද්දීපන අවස්ථා ඇයට සක්සුදක් සේ ඩැහැ ගත හැකි වූයේ වේදිකාවේ මුලින් ම ඈ ලද කටුක අභ්‍යාසයන් හේතුකොට ගෙනය.

70' දශකය අගභාගය වන විට තත්වය ක්‍රමයෙන් කණපිට පෙරලෙන්නට විය. රූපවාහිනී රතාක්ෂියා මෙරටට සංක්‍රමණය වූයේ විවෘත ආර්ථිකය හරහාය. ඌ අපගේ නිර්මල ශාන්ත සංස්කෘතික ගති ලක්ෂණ අමු අමුවේ ම ගිල දමන්නට විය. මින් අපගේ සාහිත්‍ය, කලා, සංස්කෘතිය ක්‍රමික විනාශයක් කරා යොමුවන්නට විය. කෙටි විරාමයකින් පසු, 90' දශකයේ දී යලි සක්‍රීය වේදිකාව සමඟ ගණුදෙනුවකට මා පිළිපන්නේ මෙවන් අවදියක දී ය. එතැන් සිට මා විසින් පරිවර්තනය හා අනුවර්තනය කරන ලද ඉංග්‍රීසි, ඇමරිකානු, දකුණු අප්‍රිකානු හා ඉන්දීය සම්භාව්‍ය නාට්‍ය කෘති ගණනාවකි. බුද්ධික දමයන්ත, අනුර ඒකනායක, චාමික හතලාවත්ත, මායා රණසිංහ සහ චමල් රණසිංහ මෙම නාට්‍ය කෘති නිශ්පාදනය කළ තරුණ පිරිස අතර වූහ. මෙම නාට්‍යයන් හි හා හා පුරා කියා ප්‍රධාන භූමිකාව නිරූපණය කරමින් සම්මානයට පාත්‍ර වූවෝ බොහෝ ය. සෞම්‍ය ලියනගේ. ජයනි සේනානායක, සුමිත් රත්නායක, සේමිණී ඉද්දමල්ගොඩ, දර්මප්‍රිය ඩයස්, සරත් කොතලාවල, සංජීව උපේන්ද්‍ර, අනුරාධා පෙරේරා, කුමාර තිරිමාදුරු, චමිලා පීරිස් මොවුන්ගෙන් කිහිපදෙනෙකි. 1998 සිට අද දක්වා වූ වසර දහය තුල මෙම නාට්‍ය කෘතින් සියල්ල සංස්කෘතික දෙපාර්තමේන්තුව විසින් වසරක් පාසා සංවිධානය කරන ලද නාට්‍ය උත්සව සඳහා තෝරා ගන්නා ලද අතර, යට දක්වන ලද සම්මාන වලට අතිරේකව, හොඳම නිශ්පාදන, හොඳම පරිවර්තන, අනුවර්තන යනාදී වශයෙන් ඒ ඒ වසර තුල දි අනිකුත් සම්මාන වලටද පාත්‍ර වූහ. එහෙත් 60' දශකයේ දී ඉන් මා ලද උද්දාමය, උත්තේජනය, ප්‍රමෝදය මෙකල මට විඳිය නො හැකි විය. ඊට හේතුව අද වේදිකාවේ බිහිවන රංග ධරයන්, නිර්මාණකරුවන්, ටෙලිබහිරවා විසින් ක්ෂණිකව වරින්වර කුරිරු ලෙසින් ගිලගන්නා බැවිනි. වසර පනහක කාල පරාශයක් තුල යුග දෙකක අත්දැකීම්වලින් පිරිපුන් මා අද මේ ව්‍යසනය දෙස උකටලීව බලා සිටින්නෙමි. මා විසින් රචිත, ඊනියා සම්මානයෙන් පිදුම් ලද එකද නාට්‍යයක් වරක් හෝ දෙවරකට වඩා යටකී සජීවී වේදිකාවේ රංගගත නොවීම නිසා, මාස ගණනක් එම විදේශ කෘතීන් හි පසුබිම අධ්‍යයනය කරමින් චරිත හදාරමින් ඒ පිටපත් සිංහල වේදිකාව මත සජීවී කරණය සඳහා මා ගත් උත්සහයන්, වැය කළ ශ්‍රමය, සිංහාවලෝකනය කරද්දී මට ඇතිවන්නේ ඉමහත් වේදනාවකි; කම්පාවකි.

එදා නාට්‍යකරණයේ ප්‍රායෝගික අත්දැකීම් සමඟ අපූරු උත්තේජනයක් ලද මා අද මේ ව්‍යසනය හමුවේ මන්දගාමී අලසයකු බවට පත්වෙමින් සිටින්නෙමි. ටෙලි බහිරවයා සමඟ ගැටෙන්නට අද මට බැරිය. වෑත්තෑවේ හිමියන් එදා ගුත්තිල පඬිතුමාගේ මුවට නැංවූ කවි පදයක් මගේ උපවිඥානයේ රාවප්‍රතිරාවය වේ. "මට මහළු වයසේ බැරිය වෙන ගායනා පෙර සේ..." මූසිලගේ තරුණ මදයෙන් වැයෙන වීණා හඬ පරයා, තත් සිඳුන වීණයෙන් නැඟී හඬට ගතානුගතික ශක්‍රය, විසින් නව පණක් පොවන ලදී. එහෙත් සතර දෙසින් ඇසෙන විවිධාකාර වූ කැනහිල් හූ හඬ පරයා සුමට හඬක් නැංවීමට තරම් සමත් ඉන්ද්‍රජාලයකින් අද අප අතර නොමැති වීම අපේ ම කරුමයක් නොවන්නේ ද ? හොඳම නළු - හොඳම නිළි සම්මාන ලැබූවන්ගේ පවා ඊ ළඟ පිම්ම වන්නේ මුදල ඉලක්ක කරගත් හරසුන් හරුප ටෙලි නට්‍යයයි. මෑතකදි මගේ නාට්‍ය පිටපතක සුවිශේෂී දක්ෂතා දැක්වූ තරුණ නාට්‍ය ශිල්පියකු, "......මොන ස්ටේජ් ද සර් ? ටෙලියකට සැට් වෙලා ක්ලැපර් එක උස්සං හිටියත් රුපියල් හාරපන්දහක් ගන්න පුළුවන්..." යී ප්‍රකාශ කළේය. මෙම ප්‍රකාශය පිළිබඳව අපක්ෂපාතීව, තර්කානුකූලව සිතිය හැකි යුතු කාලය එළඹ ඇත. ව්‍යසනයට මූලික හේතුව වන්නේ විවෘත ආර්ථිකයයි. මුදල ඉලක්ක කර ගත් සමාජයක සරස්වතියට ඉඩකඩක් කොයින් ද ? නාට්‍ය කලාවටම සිය ජීවන රටාව කැප කළ ප්‍රතිභාපූර්ණ නාඹර ගැටවරයෝ උකටලීව අතපය හකුලාගෙන සෝදාපාලුවට ලක්වූ නාට්‍ය වේදිකාවේ ඇන තබාගෙන සිටිනු දකින අපට ඇතිවන්නේ ඉමහත් සංවේගයකි.

ශ්‍රී ලංකාවේ බිහිවූ ප්‍රවීන මෙන් ම සහජ දක්ෂතා හා නිර්මාණකරණයේ සූක්ෂම දක්ෂතා ඇති තරුණ කලාකරුවන් කී දෙනෙක් විදේශ රටවලට සංක්‍රමණය වී අක්‍රීයව සිටිනු අපි අත්දැකීමෙන් පසක් කරගෙන සිටිමු. උදහාරණයක් වශයෙන් ගතකළ අවුරුදු තුන්සියයක් පමණ වූ කෙටි ඉතිහාසයකට හිමිකම් කියන ඔස්ට්‍රේලියාව තුල, විශේෂයෙන් මෙල්බන් පුරවරයේ බහුශ්‍රැත මෙන් ම ආධුනික කලාකරුවන් කොපමණ සිටී ද? යට දක්වන ලද මේ මහා විනාශයට විදේශ රටවල් තුල කූඩු වී නිහඬව සිටින ශ්‍රී ලාංකීය කලාකරුවන් වූ අපට කිසියම් හඬක් නැගිය යුතු කාලය එළඹ ඇතැයි මට හැඟේ.